# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,351 - 2023 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 350 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 353 |

*සැ. යු.*- (i) සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.03.25 ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර 12529 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන නවනගරය, යාය 02, අංක 87 හි පදිංචි අබේකෝන් මුදියන්සේලාගේ හීන්බණ්ඩා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/4/224 (1) යටතේ 1988.09.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

### එකී උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ, 68 සී කවුඩුලුවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කවුඩුලුවැව II පියවර නැමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ජ.පි.පො. 163 දරන පිඹුරෙහි රේඛා සටහනේ අංක 174 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.414 ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ මඩ ඉඩම.

*උතුරට* : 178,
*නැගෙනහිරට* : 170,
*දකුණට* : 171,
*බස්නාහිරට* : 154.

ඩබ්. එම්. අයි. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිය.

2023 මැයි මස 18 වැනි දින.

09-311

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.02.28 දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි/9022 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 267, යාය 12, මහඇඹගස්වැව යන ලිපිනයෙහි පදිංචි තන්තිරි අච්චිලාගේ පොඩිමහත්තයා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/11/337 යටතේ 1997.07.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

### එකී උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ, 101 නාගරපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කවුඩුලුවැව II පියවර, යාය 12 නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත රේඛා සටහන් අංක 198 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 02 ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ මඩ ඉඩම

*උතුරට* : අංක 197 මඩ ඉඩම,
*නැගෙනහිරට* : අපත් ඇළ රක්ෂිතය,
*දකුණට* : අංක 199 මඩ ඉඩම,
*බස්නාහිරට* : ඇළ රක්ෂිතය.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2023 ජුනි මස 28 වැනි දින.

09-312

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සී. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.26 දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි/7646 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 20, යාය 12, මහඅඹගස්වැව හි පදිංචි විල්වල ආරච්චිගේ ජයතිස්ස වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/28/125 යටතේ 1997.10.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 102 ජයගම්පුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කවුඩුලුවැව II පියවර, යාය 12 නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.භූ.පි. 11 අ.පි.අ. 263 දරන රේඛා සටහනේ අංක 2615 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.355 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 2607, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 2607, |
| *දකුණට* | : කැබලි අංක 2616, |
| *බස්නාහිරට* | : කැබලි අංක 2667. |

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිය.

2023 මැයි මස 18 වැනි දින.

09-313

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවග න්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.20 දින ප්‍රදානය කරන ඇති අංක ගම්/ප්‍ර/9180 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 56, නයිවල, වේයන්ගොඩ පදිංචි අලංකාර දේවගේ සෝමලතා වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 8/72 යටතේ 1988.09.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දාසිය පත්තුවේ, 99 නයිවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නයිවල නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 59/10/2,59/10/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මු.පි.ගම්. 679 දරන කට්ටි කැඩීමේ පිඹුරෙහි අංක 61 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.107 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ නයිවලවත්ත නැමැති රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 60, |
| *දකුණට* | : පී. පී. කො. 2770/1, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 62 හා 63. |

යූ. ඩබ්ලිව්. ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මීනුවන්ගොඩ.

2023 අගෝස්තු මස 02 වැනි දින.

09-345

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ
(4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය
අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් තවලම ගමගේ දීපිකා නිලංගි ඩයස් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.10.31 දින ප්‍රදානය කර ඇති අංක ගා/11/ප්‍ර 25515 - එල්. එල්. 22138 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වල්පල පහල පදිංචි ලොකුගේ පීටර් වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O.D 21/61 යටතේ 1995.11.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්පෙ උතුර පත්තුවේ, වල්පල පහල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වල්පල නැමැති ගමේ පිහිටා ඇත්තා වූද, ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූද, රජයේ ඉඩම : බටලන්දගොඩ

| | |
|---|---|
| *උතුරට* | : එල්. එල්. 22212 ඉඩම, |
| *නැගෙනහිරට* | : එල්. එල්. 22140 ඉඩම, |
| *දකුණට* | : එල්. එල්. 22140 ඉඩම, |
| *බස්නාහිරට* | : එල්. එල්. 24062 ඉඩම. |

ටී. ජී. ඩී. නිලංගි ඩයස්,
ප්‍රාදේශීය ලේකම්,
යක්කලමුල්ල.

2023 පෙබරවාරි මස 09 වැනි දින.

09-346/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ
(4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය
අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) රත්න මලල ඉරුගල් බණ්ඩාරලාගේ මාලක චතුරංග බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.03.03 දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර 9852 එල්. එල්. 59089 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බොරළුකැටියපළාත පදිංචි කුමාරවඩු සීලින් නෝනා වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 945 යටතේ 1990.11.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙන්තර වලල්ලාවිට බටහිර පත්තුවේ/ කෝරළේ නාපෙ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බොරළුකැටිය නැමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පි.පි.ගා. 373 දරන අංක 106 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 32 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම: බොරළුකැටිය

| | |
|---|---|
| *උතුරට* | : මෙම පිඹුරේ කැබලි අංක 107, |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 105, |
| *දකුණට* | : ගම් සහා පාර, |
| *බස්නාහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 108. |

ආර්. එම්. අයි. බී. එම්. සී. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බලපිටිය.

2023 මැයි මස 19 වැනි දින.

09-346/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

නැගෙනහිර පළාත් සභාවේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේ පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිද්දීක් හසත් මුසම්මිල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2010.12.20 දින ප්‍රදානය කර ඇති අංක මඩ/ප්‍රා.ලේ./කො.ප.ම. 135 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තියාවට්ටමාන් 210C දේවසාන්ති දර්මපාල වෙත ප්‍රදානය කොට මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කේ. පී. 23/2017 යටතේ 2011.07.28 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.11.03** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝරළේ පත්තුවේ තියාවට්වාන් 210C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තියාවට්මාන් නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක K 6/18, 26 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ TOPO PP-51 විසින් සම්පාදිත අංක 1078 දරන කට්ටි කැබීමේ පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.3807/ පර්චස් 13.5 ක් විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

| | |
|---|---|
| *උතුරට* | : ඉඩම් කො. අංක 1075, 1037, 1079, |
| *නැගෙනහිරට* | : ඉ. කො. අංක 1079, 1080, |
| *දකුණට* | : ඉ. කො. අංක 1080, 12, පි පි/මඩ 12523, |
| *බස්නාහිරට* | : ඉ. කො. අංක 8, 7 පි පි/මඩ 12523. |

එස්. එච්. මුසම්මිල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වාලච්චේන.

2023 පෙබරවාරි මස 22 වැනි දින.

09-347

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63919.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : MIH/LND/ CROWN/03/587/682.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 587, දොරමඩලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කට්ටමාන්කුලම ගමේ දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 03 ක් කෘෂිකාර්මික කටයුතු සඳහා මාරපන පටබැඳිගේ චමින්ද සමන් කුමාර මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | |
|---|---|
| *උතුරට* | : ජේ. මුනිදාස හිමිකම් කියන ඉඩම, |
| *නැගෙනහිරට* | : ආර්. සේනානායක සහ දිලාන් ප්‍රියදර්ශන හිමිකම් කියන ඉඩම , |
| *දකුණට* | : මාර්ගය සහ කේ. බී. පියසේන හිමිකම් කියන ඉඩම , |
| *බටහිරට* | : දයාශීලි මායාදුන්න හිමිකම් කියන ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.02.28 දින සිට 2052.02.27 දක්වා)

*වාර්ෂික බදු මුදල.*- ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. ගරු ඇමතිතුමා අනුමත

කරන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය වියයුතු අතර එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල.-* වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.02.28 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 අගෝස්තු මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-310

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70766.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
ඊපී/28/එල්බී/එල්7/එල්එස්/මඩ/කේපීඑන්/කොම්/50.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාන්කර්නි මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාන්කර්නි මධ්‍යම ගමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2023 ක් වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා වේලුපිල්ලෙහි අම්රිතලිංගම් නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පවතින දීමනාපත්‍රලාභියෙකුගේ ඉඩමක් , |
| *නැගෙනහිරට* | : | ත්‍රිකුණාමලය පාර , |
| *දකුණට* | : | පාර , |
| *බටහිරට* | : | රජයේ ඉඩමක්. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය .-* අවුරුදු තිහයි. (30) (2023.08.09 දින සිට ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල.-* 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලයන පහකට (රු. 5,000,000.00)ට වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල.-* වාර්ෂික බදු මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුත්තක් සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.08.09 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසුව වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. අයි. එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 සැප්තැම්බර් මස 06 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-348

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.